රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 167.

මගේ අංකය: 2/9/771 (එච්).
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1980 ජූලි මස 17 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙත.

## 1980 ජූලි - යෝජිත වැඩ වර්ජනය.

1980 ජූලි මස 18 වැනි දින ද ඇතුළුව, එදින සිට රජයේ සේවයේ සියළුම නිලධාරීන්ගේ ද, රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ ද, නිවාඩු අවලංගු ය.

02. 1980 ජූලි මස 18 වැනි සිකුරාදා හෝ හදිසි නීතිය පවත්නා කාලය තුළ යම්කිසි ඊට පසු වූ දිනක හෝ වැඩ වර්ජනය කිරීමේ තීරණයක ප්‍රතිඵලයක් වශයෙන් රාජකාරියට වාර්තා නො කරන රජයේ නිලධාරියෙකු හෝ රාජ්‍ය සංස්ථාවක සේවකයෙකු හෝ තම තනතුර අත්හැර ගියා සේ සලකනු ලබනු ඇත.

03. එසේ තනතුර අත්හැර ගියා සේ සලකනු ලැබූ කිසිම අයෙකුට කිසිම කරුණක් නිසා නැවතත් රාජකාරි භාර ගැනීමට අවසර නො දිය යුතුය.

04. 1980 ජූලි මස 18 වැනි දින හෝ හදිසි නීතිය පවත්නා කාලය තුළ යම්කිසි ඊට පසු වූ දිනක හෝ රාජකාරියට වාර්තා නොකරන සියළුම අයගේ නාම ලේඛනයක් තබා ගත යුතු ය.

05. ඉහත සඳහන් පරිදි යම් අය තනතුර අත්හැර ගියා සේ සලකනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන ඇබෑර්තු පිරවිය යුතුය. එසේ කිරීමට මාර්ග වශයෙන් රැකියා බැංකුව පළමුවැනි විකල්පය විය යුතුය. එසේ වුවද, සමහර අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල හා රාජ්‍ය සංස්ථාවල දැනටමත් අතිරික්ත සේවක සංඛ්‍යාවක් සිටින හෙයින්, අළුතෙන් බඳවා ගැනීම ඒ ඒ ආයතනයේ රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය වන අවමය සංඛ්‍යාවට සීමා කළ යුතු ය.

(බී. අයි. ගුණතුංග)
අතිරේක ලේකම්.

අ. ක./(ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන).
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ
ලේකම්.